**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

**වවුනියාව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2019 ජූනි 30 දින හා 2019 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වන උප වගන්තියට අනුව, මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ උපදෙස් පිළිපැදිය යුතුය. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි වර්ෂයේදී අනාවරණය කර නිවැරදි කරනු ලැබේ. |

**(ඇ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ සියලුම ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, කාර්යාල උපකරණ සහ පිරියත වල වටිනාකම් ගිණුම්වල සඳහන් කර අනාවරණය කර නොතිබුණි. | සභාවේ සියලුම වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර හෙළි කළ යුතුය. | සභාවේ සියලුම වත්කම්වල වටිනාකම් තක්සේරු කර නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි. එය ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නිවැරදි කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ එක් ස්ථාවර තැන්පතුවක පොලී ආදායම ආදායම් හා වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම ආදායම් හා වියදම් ගිණුමේ පෙන්විය යුතුය. | සභාවේ ඇති මුළු ස්ථාවර තැන්පතු සංඛ්‍යාව දහයකි. එයින් ගිණුම් 02 ක පොළිය සභාවේ ජංගම ගිණුමේ මාසිකව තැන්පත් කර තිබුණි. ගිණුම් අංක 2449422 හි කල්පිරීමේ කාලය 2021 වන අතර එමගින් 2021 දී පොළිය ලැබෙනු ඇත. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් ඔප්පු සහ ස්ථාවර වත්කම් ලේඛණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.107,245,205 ක් වටිනා ගිණුම් අයිතම හතරක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. | සහතික කරන ලද සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඉඩම් ලේඛන ලබා ගැනීම සඳහා අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර තිබුණි. කෙසේ වෙතත්, කිසිදු ලියවිල්ලක් ලැබී නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය | සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු නීති විධිවිධාන ප්‍රකාරව | අපද්‍රව්‍ය කළමනාකරණය වාර්ෂික සැලැස්මට | එය ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක |

| | | | | |
|---|---|---|---|---|
| | | සිදු කර නොතිබුණි. | ඇතුළත් කළ යුතුය. | කෙරේ. |
| (ආ) | 1952 අංක 6 දරන පළාත් පාලන ආඥාපනත යටතේ වූ අතුරු ව්‍යවස්ථා වගන්ති XI හා XII. | අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත් කරමින් වාර්ෂික සැලැස්මක් සකස් කර නොතිබුණි. | - | එය ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කෙරේ. |
| (ඇ) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනත | සන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | පනතේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එය ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කෙරේ. |
| (ඈ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) රීති අංක 59 | වෙළඳ බද්ද සම්බන්ධයෙන් සමීක්ෂණයක් සෑම වර්ෂයකම ආරම්භයේ දී සභාවේ විෂය පථය යටතේ ආදායම් පරීක්ෂක, ආදායම් අධීක්ෂක හෝ සභාපති විසින් බලය පවරන ලද වෙනත් කිසිදු නිලධාරියෙකු විසින් සිදු කර නොතිබුණු අතර 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව වෙළඳාම පිළිබඳ කාලසටහනක් නොතිබීම සකස් කර නොතිබීම නිසා වෙළඳ බදු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීතියට අනුව ක්‍රියා කළ යුතුය. | වෙළඳාම සම්බන්ධයෙන් කාලසටහනක් ඉදිරි කාලවලදී සකස් කර වෙළඳ බදු අයකර ගැනීමට පියවර ගනු ලැබේ. |
| | (ii) රීති අංක 218 | සියලුම ඉඩම් හා ගොඩනැගිලි සභාපතිවරයා විසින් අවම වශයෙන් සෑම වසරකට වරක්වත් පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීතියට අනුව ක්‍රියා කළ යුතුය. | ඉඩම් ලියකියවිලි ලබා ගැනීමට අපොහොසත් වීම නිසා ඒවා පරීක්ෂා කර නොතිබුණි. |
| | (iii) රීති අංක 33 | තක්සේරු බද්ද සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීතියට අනුව ක්‍රියා කළ යුතුය. | ආරම්භක අදියරේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) III කොටසෙහි 32 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා දේපල සඳහා තක්සේරු බද්ද පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීතියට අනුව ක්‍රියා කළ යුතුය. | දේපල සඳහා තක්සේරු බද්ද අය කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ නිලධාරීන් 02 දෙනෙකුට ගෙවා ඇති රු.94,384 ක ණය ආපසු අයකර ගැනීමට පසුගිය වසර 05 තුළ අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ රීති / චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එය ඉහත කී පුද්ගලයින් සමඟ සන්නිවේදනය කළ නොහැක. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛණ නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එය ඉදිරි කාලවලදී නඩත්තු කෙරේ. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ. |
| | (iii) මුදල් රෙගුලාසි 891 | ඇප පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එය ඉදිරි කාලවලදී නඩත්තු කෙරේ. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 178(3) වගන්තිය | ප්‍රජා මූලික සංවිධාන සහ කොන්ත්‍රාත් කටයුතු එලදායී ලෙස සිදුකරන ප්‍රජා මධ්‍යස්ථාන නම් ඇතුළත් ලේඛනයක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එය ඉදිරි කාලවලදී නඩත්තු කෙරේ. |
| (ඌ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක. 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදයේ IV වගන්තිය. | ස්ථිර රාජකාරි වේලාවෙන් පසු වේලාව මත පදනම්ව ගෙවනු ලැබූ අතිකාල දීමනා සහ නිවාඩු ගෙවීම් වැනි දීමනා ගෙවීමට කාලය | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | 2019 වර්ෂයේ සිට ඇඟිලි සළකුණු යන්ත්‍ර සලකා බලමින් අතිකාල සහ නිවාඩු ගෙවීම් |

| | | | | |
|---|---|---|---|---|
| | | පදනම් වී ඇත්නම්, එවැනි වේලාවන් ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් තහවුරු කළ යුතුය. කෙසේ වෙතත්, අතිකාල හා නිවාඩු වැටුප් රු.423,117 ක් සභාවේ ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් තහවුරු කර නොගෙන ගෙවා තිබුණි. | | සිදු කෙරේ. |
| (එ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක. 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය | ටැංකියේ ඉන්ධන සම්පූර්ණයෙන් පුරවා වාහනය ධාවනය කිරීමෙන් සෑම වසරකට වරක් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, ඒ අනුව පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ සිට සෑම වසරකම වාහන සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කරනු ලැබේ. |
| (ඒ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක. IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක සහ එහි උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එය ඉදිරි කාලවලදී නඩත්තු කෙරේ. |
| (ඔ) | වත්කම් කළමනාකරණය පිළිබඳ 2017 ජූනි 28 දිනැති අංක. 1/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති අතර සභාවේ සියලුම වත්කම් ලේඛනගත කිරීම පිළිබඳව පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට මෙන්ම ලේඛනගත කිරීමට පියවර ගෙනු ලැබේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ---------- | ----------------------------- |
| සභාවේ එකතු කළ අගය මත බද්ද (වැට්) සම්බන්ධ ගනුදෙනු වලදී, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු සඳහා එකතු කළ අගය මත බදු මුදල ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට හෝ සැපයුම්කරුවන්ට | එකතු කළ අගය මත බදු සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව | සභාවේ වැට් බදු පිළිබඳ වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබුණි. |

| | |
|---|---|
| ගෙවිය යුතුය. එම ගෙවීම් පිළිබඳ විස්තර ඊළඟ මාසයේ 15 වන දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. රු.637,020 ක් වටිනා එකතු කළ අගය මත බදු ගෙවීම් විගණනයට දැනුම් දී නොතිබුණි. | ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,014,163 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,529,883 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 5,083,000 | 8,193,746 | 5,428,263 | 2,765,483 | 4,270,000 | 6,248,305 | 5,174,410 | 1,073,895 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 940,000 | 793,166 | 793,166 | - | 725,000 | 3,390,165 | 3,390,125 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,237,000 | 11,709,798 | 5,902,629 | 5,807,169 | 8,265,000 | 14,530,648 | 9,645,776 | 4,884,872 |
| | එකතුව | **15,260,000** | **20,696,710** | **12,124,058** | **8,572,652** | **13,260,000** | **24,169,118** | **18,210,351** | **5,958,767** |

**2.2.2** **ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.20,563,277 ක මුදලක් අයකර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ ආදායම අයකර ගැනීමට සභාව පියවර ගත යුතුය. | ප්‍රදාන, උසාවි දඩ, මුද්දර ගාස්තු හැර අනෙකුත් හිඟ මුදල් පියවන ලෙස අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙන ලදී. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට හිඟ රු.8,572,652 ක ආදායමක් අයකර ගැනීමට සභාව කිසිදු අර්ථවත් පියවරක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම අයකර ගැනීම සඳහා සභාව විසින් අදාළ පියවර ගත යුතුය. | ප්‍රදාන, උසාවි දඩ, මුද්දර ගාස්තු හැර අනෙකුත් හිඟ මුදල් පියවන ලෙස අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙන ලදී. |
| (ඇ) අයවැය ඇස්තමේන්තුව නිසියාකාරව සකස් කර නොතිබූ අතර ඇස්තමේන්තුව නිසි පරිදි සැලසුම් කර වැඩසටහන්ගත කර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායම සහ සැබෑ ආදායම අතර රු.40,870 ක සිට රු.7,097,844 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය නිසි ලෙස සකස් කළ යුතුය. | අනපේක්ෂිත ආදායමක් ලැබී තිබුණු අතර සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ප්‍රදාන වෙනුවෙන් අයවැය සකස් කර ඇති බැවින් එමගින් විචලනයන් ඇති විය. |

**2.2.3** **වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ III වන පරිච්ඡේදයේ 32 වන වගන්තිය ප්‍රකාරව දේපල සඳහා තක්සේරු බද්ද පිළිබඳ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති උපදෙස් අනුව දේපල සඳහා තක්සේරු බදු ලේඛනයක් පවත්වාගෙන යාමට සභාව විසින් පියවර ගත යුතුය. | අදාළ ඉඩම් ලේඛනය සාමාන්‍ය ජනතාව සතුව නොමැති අතර ඉඩම් වටිනාකම යාවත්කාලීන කර නොතිබූ බැවින් දේපල සඳහා තක්සේරු බද්ද අය කර ගත නොහැකි විය. කෙසේ වෙතත්, තක්සේරු බද්ද අයකර ගැනීමේ මූලික කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් දත්ත එක්රැස් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබුණි. |

## 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ විෂය පථය යටතේ වූ සියලුම කුටි සඳහා හිඟ මුදල් අයකර ගැනීමට සභාව කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සියලුම කුටිවල කුලිය අය කර ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. | හිඟ මුදල් පියවන ලෙස අදාළ පාර්ශ්වයන්ට උපදෙස් දී තිබුණි. |
| (ආ) | පසුගිය වසර 04 තුළ සභාව යටතේ වූ කුටිවල රු.1,565,690 ක හිඟ කුලී මුදල් අය කර ගෙන නොතිබුණි. | කුටිවල හිඟ කුලී අය කර ගැනීමට සභාව විසින් පියවර ගත යුතු අතර මෙම කුටි නිසි ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. | බොහෝ අවස්ථාවන්හිදී එම සාප්පු සංකීර්ණය සඳහා ටෙන්ඩර් දැන්වීමක් සහ නැවත ටෙන්ඩර් දැන්වීම් පළ කර තිබුණද කිසිවෙකු ලංසු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවෙතත්, ආපසු ගෙවන තැන්පතු ගෙවා නොමැති වෙළඳ කුටිවලද කුටි ගිවිසුම් අවලංගු කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විෂය පථය යටතේ වූ රු.20,883 ක හිඟ බදුකුලිය අය කර ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විෂය පථය යටතේ වූ කුටිවල හිඟ බදුකුලී මුදල් අය කර ගත යුතුය. | හිඟ මුදල් පියවන ලෙස අදාළ පාර්ශ්වයන්ට උපදෙස් දී තිබුණි. |
| (ඈ) | සභාවේ විෂය පථය යටතේ වූ රු.229,050 ක හිඟ බිම් කුලී මුදල් අය කර ගෙන නොතිබුණි. | සභාවේ විෂය පථය යටතේ වූ හිඟ බිම් කුලී මුදල් අය කර ගත යුතුය. | හිඟ මුදල් පියවන ලෙස අදාළ පාර්ශ්වයන්ට උපදෙස් දී තිබුණි. |

## 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතන 243 කට පමණක් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණු අතර අනෙක් සියලුම ආයතනවලට වෙළඳ බලපත්‍ර | සියලුම ආයතනවලට වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට | සමාලෝචනයට භාජනය වූ වර්ෂයේදී සභාවේ විෂය පථය යටතේ වෙළඳ මධ්‍යස්ථාන 243 කට වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. කෙසේවෙතත්, මහජන සෞඛ්‍ය |

| | | |
|---|---|---|
| නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පියවර ගත යුතුය. | පරීක්ෂකවරුන්ගේ නිර්දේශයක් නොමැතිවීම හේතුවෙන් ඉතිරි වෙළඳ මධ්‍යස්ථානවලට බලපත්‍රය නිකුත් කර නොතිබුණි. එය අදාළ වෙළඳ මධ්‍යස්ථාන වෙත ලිපියක් මගින් දන්වා තිබුණි. |

**2.2.6 වෙනත් ආදායම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කුටිවල හිඟ කුලී මුදල් සම්බන්ධයෙන් දඩ මුදල් අයකර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දඩ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. | දඩ මුදල් අයකර ගන්නා ලෙසට උපදෙස් දෙන ලදී. |

**2.2.7 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | **උසාවි දඩ මුදල්** | | |
| | 2018 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.6,461,470 ක උසාවි දඩ මුදලක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ මුදල් අය කිරීමට පියවර ගත යුතුය. | උසාවි දඩ මුදල් ලිපියක් මගින් ලබා ගන්නා ලෙස ඉල්ලීමක් පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. |
| (ආ) | **මුද්දර ගාස්තු** | | |
| | 2018 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.951,750 ක මුද්දර ගාස්තු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියලු බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබුණි. | මුද්දර ගාස්තු අය කිරීමට පියවර ගත යුතුය. | ලිපියක් මගින් මුද්දර ගාස්තු ලබා ගන්නා ලෙස ඉල්ලීමක් පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහජන සෞඛ්‍ය, මහජන උපයෝගීතා සේවා සහ මහජන මංපෙත් විධිමත් කිරීම සහ සුවපහසුව, පහසුව සහ ජනතාවගේ සුභසාධනය වැනි කාරණා විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු විය. නමුත් 2018 දෙසැම්බර් 31 වන විට පවා අතුරු ව්‍යවස්ථා බලාත්මක කර නොමැත. | ප්‍රදේශ් සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | 2018 සැප්තැම්බර් 05 දින ප්‍රකාශයට පත් කරන ලද උතුරු පළාතේ අතුරු ව්‍යවස්ථාව 2019 ජුනි 07 දින සභාව විසින් පිළිගෙන ඇත. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | ඉදිරි කාලවලදී සැලැස්මක් සකස් කරන ලෙසට උපදෙස් දෙන ලදී. |

**(ඇ) ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් සිදු කරන ලද කොන්ත්‍රාත් වැඩ හතක් අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා හේතු විගණනය සඳහා ලබා දී නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ සැලසුම් කර ඇති වැඩ නිම කිරීමට පියවර ගත යුතුය. | එවැනි වැඩ නිම කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, අසාමාන්‍ය තත්වයන් හේතුවෙන් කාලය දීර්ඝ කරන ලදී. |

( ඇ )

**සන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරන ලදී.

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශ** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම්** |
|---|---|---|---|
| (i) | කසළ බැහැර කරන ස්ථාන සඳහා පාරිසරික බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි ලෙස ස්ථාපිත කළ යුතු අතර අපද්‍රව්‍ය වෙන්කිරීම විධිමත් කිරීම හා ඒවා නැවත භාවිතා කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් පරිසරයට හානියක් නොවන පරිදි ක්‍රියාත්මක කිරීමෙන් ස්වාභාවික පොහොර නිපදවීමට පියවර ගත යුතුය. | බලපත්‍ර ලබා ගැනීමට පියවර ගනිමින් සිටී. |
| (ii) | සනීපාරක්ෂක කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර නොතිබුණි . | | වෛද්‍ය පරීක්ෂණය ඉදිරි කාලවලදී සිදු කෙරේ. |
| (iii) | කසළ වෙන වෙනම වර්ගීකරණය කොට එකතු කර නොතිබුණි. | | කසළ වෙන වෙනම වර්ගීකරණය කොට එකතු කිරීමට පියවර ගනිමින් සිටී. |
| (iv) | සභාවේ කසළ බැහැර කරන ස්ථානයට ගෙන එන කසළ වර්ගීකරණය කිරීමේ වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | කසළ වෙන වෙනම එකතු කිරීමට පියවර ගැනීමට සැලැස්ම සකස් වෙමින් පවතී. |
| (v) ( | ප්‍රතිචක්‍රීකරණයට භාජනය කිරීමෙන් තොරව පරිසරයට හානි වන අයුරින් සන අපද්‍රව්‍ය ගිනි තබා තිබුණි. | | ප්‍රතිචක්‍රීකරණය සඳහා ප්‍රමාණවත් පහසුකම් සහ අරමුදල් නොතිබුණි. |
| (vi) | සන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු නීතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | | ඉදිරි කාලවලදී නීති හා රීති අනුගමනය කරනු ඇත. |
| (vii) | අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. | | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් පවතී. |
| (viii) | සභාවට අයත් ප්‍රදේශයේ නිවාස සහ කුටිවලින් කුණු කසළ වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කොට ඒවා මලුවලට එකතු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | වර්ගීකරණය කිරීම සඳහා කසළ ප්‍රමාණවත් ලෙස එකතු කර නොතිබුණි. |

**ඉ)** **තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක ඒ.එස්.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සභාවේ පෙර සූදානම් වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. | එය දැනුම් දී නොතිබුණි. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.33,601,810 ක් වටිනා සභාවේ ස්ථාවර තැන්පතු ශේෂ 10 ක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකර අඛණ්ඩව තැන්පතු ලෙස පැවතුනි. | ස්ථාවර තැන්පතු අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතුය. | මුල් කාල පරිච්ඡේදය තුළදී, සමස්ත කාර්ය මණ්ඩලයේ ප්‍රතිපූරණය කරන ලද වැටුප් ප්‍රමාණයෙන්, අතිරික්ත මුදලක් අරමුණක් සඳහන් කිරීමෙන් තොරව ස්ථාවර තැන්පතු 06 ක් ලෙස තැන්පත් කර තිබුණි. එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් තවත් ස්ථාවර තැන්පතු හතරක් වසා දමා නොතිබුණි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විටත් ණය හිමියන්ට ගෙවිය යුතු රු.16,545,147 ක මුදලක් පියවීමට අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම මුදල ණය හිමියන්ට ගෙවීමට පියවර ගත යුතුය. | රු.16,097,150.28 ක් සම්පූර්ණ නොකළ කොන්ත්‍රාත් වැඩ සඳහා වන ගෙවීම් වන අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා වියදම් ඉන්වොයිසි ලැබී නොතිබුණි. ඒ අනුව රු.447,996.90 ක් නිරවුල් කර නොතිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) සේවක මණ්ඩල පුරප්පාඩු** | | |
| 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු එකොළහක් පුරවා නොතිබුණි. | සේවක පුරප්පාඩු පිරවිය යුතුය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පරිපාලන වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණි. |
| **(ආ) සේවක ඇප තැන්පතු** | | |
| සභාවේ නිලධාරීන් 02 දෙනෙකුට ගෙවා ඇති රු.94,384 ක ණය ආපසු අයකර ගැනීමට පසුගිය වසර 05 තුළ අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ නිතිපතා ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. | එය අදාළ නිලධාරීන් සමඟ සන්නිවේදනය කළ නොහැකි විය. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තු හා අළුත්වැඩියා කිරීමට අසමත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අංක ඊපී එච්ආර් 2742 දරණ යතුරුපැදියක් සහ අංක එන්පී කියුආර් 6033 දරණ ත්‍රිරෝද රථයක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි ආකාරයෙන් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | උතුරු නැගෙනහිර පළාත ඒකාබද්ධව පැවති කාල සීමාව තුළ ඊපී එච්ආර් 2742 දරණ යතුරුපැදිය නිකුත් කර තිබුණි. එය අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණි. |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදු කර නොමැති අතර ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. ඉඩම් හා ගොඩනැගිලි නිතිපතා සත්‍යාපනය කිරීමෙන් සභාවට අයත් එවැනි වත්කම්වල අයිතිය සහතික කර නොතිබුණි. | සභාවට හිමිකාරිත්වය පැවරීමට පියවර ගත යුතුය. | ඉඩම් ඔප්පු ලබා ගැනීම සඳහා වන අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, කිසිදු ලියවිල්ලක් ලැබී නොතිබුණි. |
| (ආ) | සභාවට පරිත්‍යාග කරන ලද වාහන 07 ක අයිතිය සභාවට පැවරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාවට හිමිකාරිත්වය පැවරීමට පියවර ගත යුතුය. | හිමිකාරිත්වය පැවරී නොමැති වාහනවල අයිතිය පැවරීමට පියවර ගනිමින් සිටී. |

**3.4.3 නිෂ්ක්‍රීය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 අගෝස්තු 12 වන දින හදිසි උතුරු ප්‍රතිසාධන ව්‍යාපෘතිය මගින් සභාව වෙත භාරදුන් රු.26,137,591 ක වියදමින් ඉදිකරන ලද බස් නැවතුම්පළක් භාවිතා කිරීමට සභාව විසින් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. | අවස්ථා බොහොමයකදී බස් නැවතුම්පොළ ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා ටෙන්ඩරයක් කැඳවා තිබුණි. කෙසේවෙතත්, කුටිය නිෂ්ක්‍රීයව පැවතුනි. |
| (ආ) | 2017 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලබාගත් විදුලි මෝටරයක් භාවිතා කිරීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. | මරුතෝඩෙයි ජල සැපයුම් යෝජනා ක්‍රමය යටතේ සවි කර ඇති විදුලි මෝටරයක් වෙනුවට එය ලබාගෙන තිබුණි. එය පරිත්‍යාගයක් ලෙස ලබාගෙන නොතිබුණි. ඇස්තමේන්තුව අනුව එය ලබාගෙන තිබුණි. |

**3.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුය. | එය ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. |
| (ආ) | 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 438 ප්‍රකාරව පෙර වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ භාවිතයට ගත නොහැකි යැයි සඳහන් කර ඇති භාණ්ඩ වර්ග 16 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | එය ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.362,019 ක ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතුය. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. කෙසේ වෙතත්, නිසි මිල ගණන් කැඳවීමේ ක්‍රමයක් අනුගමනය කිරීමෙන් ශෘහ භාණ්ඩ මිලදී ගෙන ඇත. |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත කර ඇති රු.803,274 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ පහළොවක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් කාලය තුළ වැඩ නිම කිරීමට පියවර ගත යුතුය. | කොන්ත්‍රාත් නීතිරීතිවලට අනුව වැඩ නිම කරන ලෙස අදාළ කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, අයහපත් කාලගුණය සහ වෙනත් |

| | | |
|---|---|---|
| | | හේතු නිසා එය සම්පූර්ණ කිරීමට නොහැකි විය. |
| (ආ) අයවැය ලේඛනයකින් තොරව ආරම්භ කරන ලද රු.61,098 ක් වටිනා කොන්ත්‍රාත් වැඩ දෙකක් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අවසන් කර නොතිබුණි. | අයවැයක් සකස් කර කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට පියවර ගත යුතුය. | එය අත්‍යාවශ්‍ය බැවින් සභාවේ තීරණයට අනුව එය සිදු කර ඇත. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

------------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබුණු අතර ඇස්තමේන්තුව නිසිලෙස සැලසුම් කර වැඩසටහන් ගත කර නොතිබුණු අතර ඒ අනුව අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර රු.11,038 සිට රු.7,527,351 ක් දක්වා විචලනයන් සිදුවිය. | අයවැය කාර්යක්ෂම පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. | ඉදිරි කාලවලදී නිසි ලෙස සැසඳීමෙන් අයවැය සකස් කිරීමට උපදෙස් දෙන ලදී. |